## නියමයන් සහ කොන්දේසි

### මූල්‍ය සමාගම් වල වගකීම්

- ත්‍රිරෝද රථය ෆිනෑන්ස් පහසුකමක් යටතේ ලබාගෙන තිබේ නම්, වාහනය පරිවර්තනය කිරීම සඳහා ෆිනෑන්ස්/ලීසිං සමාගමෙන් විරෝධය නොදැක්වීමේ ලිපියක් අවශ්‍යය.
- ඉවත් කරන ලද එන්ජිම විකිණීමට කටයුතු කරන තෙක් ෆිනෑන්ස්/ලීසිං සමාගම එන්ජිම තම භාරයේ තබා ගැනීමට එකඟ වන අතර එන්ජිම විකිණීමෙන් ලැබෙන ආදායම ෆිනෑන්ස්/ලීසිං ගිවිසුමට අනුකූලව ගිනුමට බැර කෙරේ.
- ත්‍රිරෝද රථයේ සම්පූර්ණ හිමිකරු තනි පුද්ගලයෙකු නම්, පරිවර්තන ක්‍රියාවලියෙන් ඉවත් කරන ලද එන්ජිම එම පුද්ගලයාටම නැවත ලබා දෙනු ඇත.

### අයිතිකරුගේ වගකීම්

- ගමන් දුර, වේගය, ඒකක පරිභෝජනය යනාදිය පිළිබඳ අවශ්‍ය දත්ත සැපයීම සහ ත්‍රිරෝද රථ විදුලි ත්‍රිරෝද රථ බවට පරිවර්තනය ප්‍රවර්ධනය කිරීමේ ඉදිරි වැඩසටහන් සඳහා සහභාගී වීමට ලියාපදිංචි හිමිකරු කැමැත්තෙන් සිටිය යුතුය.
- ත්‍රිරෝද රථය තෝරාගත් පරිවර්තන මධ්‍යස්ථානයකට ගෙන යා යුතුය.
- පරිවර්තනය කරන සීමාව තුළ සහ ඉන් පසු විදුලි වාහනය ලියාපදිංචි කිරීමේ කාලසීමාවේදී ත්‍රිරෝද රථ හිමිකරුට කිසියම් ආදායම් අහිමි වීමක් දැරීමට සිදුවේ නම්, එම අලාභය දරාගැනීමට හිමිකරු එකඟ විය යුතුය. එම කාලසීමාව දින 14කට වැඩි වන්නේ නැත.
- විදුලි ත්‍රිරෝද රථ සඳහා අවශ්‍ය රක්ෂණ ආවරණ ලබා ගැනීමේ වගකීම අයදුම්කරු වෙත පැවරේ.

### ත්‍රිරෝද රථ පරිවර්තනය භාර ගන්නා සේවා සපයන්නාගේ වගකීම

- පරිවර්තනය කරන ලද ත්‍රිරෝද රථයේ ලියාපදිංචි හිමිකරුට එම රථය ක්‍රියාත්මක කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ නිසි පුහුණුවක් ලබා දෙනු ඇත.
- මෙහෙයුම් උපදෙස් අනුගමනය කිරීමට සහ ඔවුන්ට ලබා දී ඇති නියමයන් සහ කොන්දේසි අනුව අවශ්‍ය දත්ත සහ තොරතුරු සැපයීම සිදු කරනු ලැබේ.
- පරිවර්තනය කර සපයනු ලබන ත්‍රිරෝද රථ ගෘහස්ථ සහ වාණිජමය වශයෙන් පවත්වාගෙන යන ආරෝපණ මධ්‍යස්ථාන හරහා ආරෝපණය කළ හැකි පරිදි ලබා දෙනු ඇත.
- නැවත ලියාපදිංචි කිරීම ඇතුළුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙහි වාහනය පරිවර්තනය කිරීමට අදාළ සියලුම ක්‍රියා පටිපාටි පරිවර්තන සැපයුම්කරු විසින් සිදු කරනු ලැබේ

### තෝරාගැනීමේ පටිපාටිය

- ඉහත සඳහන් තේරීම් නිර්ණායක මත පදනම්ව සුදුසුකම් සපුරනු ලබන අයදුම්පත් පමණක් ලොතරැයි දිනුම් ඇදීමක් සඳහා සුදුසුකම් ලබන අතර පරිවර්තනය සඳහා අවසාන තේරීම රඳා පවතින්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ යෝග්‍යතා අනුමැතිය මත පමණක් බව කරුණාවෙන් සලකන්න.
- ලොතරැයි දිනුම් ඇදීම සඳහා පොදු උත්සවයක් පවත්වනු ලැබේ.



ඔබ ඉහත සුදුසුකම් සපුරන්නේ නම් මෙම ව්‍යාපෘතිය පිළිබඳ වැඩි විස්තර ලබාගැනීම සඳහා සහ මෙම ව්‍යාපෘතිය සඳහා ලියාපදිංචි වීමට කැමති නම්, කරුණාකර අප හා සම්බන්ධ වන්න:

**074 330 9687**

සාමාන්‍ය ඇමතුම් හා WhatsApp මගින්

UNDP

DMT Drive Sri Lanka

N.T.C National Transport Commission

# e-TUK TUK


## ශ්‍රී ලංකාව තුළ තිරසාර ප්‍රවාහන භාවිතයක් උදෙසා පුනර්ජනනීය බලශක්තිය





රටෙහි පවතින වත්මන් සමාජ-ආර්ථික අර්බුදය හමුවේ රට නැවත යථා තත්වයට පත්වීමේදී, පරිසර හිතකාමී ක්‍රියාවලියක් වෙත යොමුවීම සහ අනාගතයේදී ශක්තිමත් රටක් ලෙස ගොඩනැගීම වෙනුවෙන් තිරසාර ප්‍රවාහන මාධ්‍යන් වෙත යොමුවීම අත්‍යවශ්‍ය බව හඳුනාගෙන ඇත.

ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ප්‍රවාහන අමාත්‍යාංශය, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සහ ජාතික ගමනාගමන කොමිෂන් සභාව සමඟ තවත් හවුල්කරුවන් එක්ව කටයුතු කරමින් රට තුළ විදුලි බලය භාවිත කරන ප්‍රවාහන මාධ්‍යන් ප්‍රචලිත කිරීමට කටයුතු කරමින් සිටියි. පරිසර හිතකාමී සහ සුපිරිසිදු ශ්‍රී ලංකාවක් නිර්මාණය කිරීම සඳහා වන රජයේ ක්‍රියාමාර්ග වලට සහාය වීම එහි අරමුණයි.



## පෙට්‍රල් ත්‍රිරෝද රථ විදුලි ත්‍රිරෝද රථ බවට පරිවර්තනය කිරීමේ අරමුණු පහත දැක්වේ:

- ශ්‍රී ලංකාවේ ජනතාවට ආර්ථික අර්බුදයේ බලපෑම අවම කිරීම
- ප්‍රවාහන මාධ්‍යයන් වැඩි දියුණු කිරීම
- ශ්‍රී ලංකාව තුළ පරිසර දුෂණය අවම කර තිරසාර සංවර්ධන ව්‍යාපෘති සඳහා පහසුකම් සැලසීම
- කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ අත්‍යාවශ්‍ය සේවා නඟාසිටුවීම


## යෝජිත ව්‍යාපෘතිය ප්‍රධාන අදියර තුනකින් සමන්විත වේ.

- නියමු අදියර තුළදී පෙට්‍රල් ත්‍රිරෝද රථ විදුලි ත්‍රිරෝද රථ හෙවත් e-Tuk Tuk බවට පරිවර්තනය කිරීම පරික්ෂා කරනු ඇත.
- කඩිනම් කිරීමේ අදියර තුලදී වෙළඳපොළ බලවේග යොදා ගනිමින් සහනදායි මූල්‍ය ක්‍රම හරහා විදුලි ත්‍රිරෝද රථ බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කරනු ඇත.
- හඳුන්වාදීමේ අදියර තුළදී ත්‍රිරෝද රථ විදුලි ත්‍රිරෝද රථ බවට පරිවර්තනය ව්‍යාප්ත කිරීම සඳහා මූල්‍ය අංශය සම්බන්ධ කරගනු ඇත.


මෙම නියමු ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ප්‍රාදේශීය ආර්ථිකයට අත්‍යවශ්‍ය වී තිබෙන මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම තුලින් ක්ෂුද්‍ර මට්ටමේ/අවිධිමත් අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් පුනර්ජීවනය කිරීමට සහය වීමයි.

මෙම අදියරේදී පෙට්‍රල් ත්‍රිරෝද රථ 200ක් විදුලි ත්‍රිරෝද රථ බවට පරිවර්තනය කෙරෙන අතර බස්නාහිර පළාත තුල පහත සඳහන් කලාප දෙකෙන් පෙට්‍රල් ත්‍රිරෝද රථ 100 බැගින් ඒ සඳහා තෝරා ගනු ලැබේ.

- මාකුඹුර (බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය අසල)
- පිටකොටුව



## විදුලි ත්‍රිරෝද රථ:




## වාහන සහ හිමිකරුවන් සපුරාලිය යුතු සුදුසුකම්

- ත්‍රිරෝද රථය නිෂ්පාදිත දිනයේ සිට වසර 10 කට වඩා පැරණි නොවිය යුතුය.
- ත්‍රිරෝද රථය පෙට්‍රල් සිව් පහර හෙවත් Four-stroke ත්‍රිරෝද රථයක් විය යුතුය.
- පිටකොටුව, මාකුඹුර බහුවිධ මධ්‍යස්ථානය යන ප්‍රදේශවල ක්‍රියාත්මක වන ත්‍රිරෝද රථවල අයදුම්කරුවන් පමණක් විය යුතුය.
- තෝරාගැනීමේදී කාන්තා ත්‍රිරෝද රථ හිමිකාරිනියන් හා කාන්තා ත්‍රිරෝද රථ රියදුරන් සඳහා ප්‍රමුඛතාව ලැබේ
- තමන්ට හිමි තනි ත්‍රිරෝද රථයකින් ජීවනෝපාය සපයාගන්නා අයදුම්කරුවන්ටද ප්‍රමුඛත්වය දෙනු ලැබේ.
- විද්‍යුත් පරිවර්තනයේ සම්පූර්ණ වියදම එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) විසින් දරනු ඇත.

ඔබ ඉහත සුදුසුකම් සපුරන්නේ නම් මෙම ව්‍යාපෘතිය පිළිබඳ වැඩි විස්තර ලබාගැනීම සඳහා සහ මෙම ව්‍යාපෘතිය සඳහා ලියාපදිංචි වීමට කැමති නම්, කරුණාකර අප හා සම්බන්ධ වන්න:

**074 330 9687**
සාමාන්‍ය ඇමතුම් හා WhatsApp මගින්